# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## 01 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ ඒකාබද්ධ ශේෂ පත්‍රයේ ජංගම නොවන වත්කම් තුළ වූ වෙනත් මූල්‍ය වත්කම්වල වටිනාකම රු: 60,968,207,000 ක් වූ අතර, එම වටිනාකම නියෝජනය වන වත්කම් නිශ්චිතව නොපැවතුණි. ව්‍යාපෘතිවල සියළු පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්, ජලාශ හා වැව් පුනරුත්ථාපනය හා නඩත්තුව සඳහා දරන වියදම්, ආදිය මෙම මූල්‍ය වත්කම්වල ඇතුළත් වූ අතර, මේවා ක්ෂය කිරීමේ හෝ ක්‍රමක්ෂය කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මකවී නොතිබුණි. මේ අනුව එම වත්කම්වල පැවැත්ම පිළිබඳ විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය.

#### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

සී/ස මහවැලි සත්ව ව්‍යාපාරික (පුද්ගලික) සමාගමේ ප්‍රයෝජනය සඳහා ලබාදී තිබූ අධිකාරියට අයත් අංක: 260/20 දරන ස්ථානයේ පිහිටි ගොඩනැගිල්ල, ජාවත්ත පාරේ, අංක: 11 ස්ථානයේ පවතින වෙළඳ සැල සහ නිරාවිය සහ කලංකුට්ටිය ගොවිපල ඉඩම් සඳහා වූ බදු කුලී ගණනය කර ගිණුම්වලට ඇතුලත් කර නොතිබුණි.

#### 1.2.3 නොසැසඳූ පාලන ගිණුම්

නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාල 09 ක 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බදු ආදායම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව රු: 332,230,109 ක් වූ අතර, ඉඩම් අංශයේ වාර්තා අනුව එම වටිනාකම රු: 294,355,000 ක් වූයෙන් රු: 37,875,109 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-------------------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ආදායම රු: 364,966,000 ක් ව අතර, ඉන් 72% ක් එනම් රු: 266,557,000 ක් වර්ෂ 1 ට වඩා වැඩි කාලයක වූ අතර, 20% ක් එනම් රු: 75,829,000 ක් වර්ෂ 5 ට වඩා වැඩි කාල පරාසයක පැවතුණි. මෙම ලැබිය යුතු ආදායමෙන් 42.5% ක් එනම් රු: 156,699,160 ක් $එච්. කලාපයෙන් අයවිය යුතුව තිබුණි.

(ආ) $එච්. හා $බී. කලාපවලින් අධිකාරියට ලැබිය යුතු බදු ආදායමින් පිළිවෙලින් රු: 50,694,000 ක් හා රු: 1,795,000 ක් 2010 වර්ෂයේදී අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර තිබුණි. මෙසේ වෙන් කිරීම සඳහා වූ අනුමැතිය මෙම බදු අයකිරීමට වගකිවයුතු නිලධාරීන් සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග, විස්තරාත්මක වාර්තා ආදිය විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඇ) මහවැලි වෙනචර් කැපිටල් සමාගමට අයවිය යුතුව තිබූ ආදායම් වූ රු: 291,264ක මුදලින් රු: 221,306 ක් දීර්ඝ කාලයක සිට අයවිය යුතුව පවතින ව්‍යවසායකත්ව ණය සඳහා වූ පොළිය සමාලෝචිත වර්ෂයේද අයනොවී පැවතුණි. $ණය පොළී පමණක් නොව, ඊට අදාල ණය මුදලද ඇතුළත්ව රු: 8,619,071 ක මුදලක් ගිණුම්වලින් කපා හැරීම සඳහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ඉල්ලා ඇති බව. අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර විය.

(ඈ) 2011 දෙසැම්බර් 31 දිනට අයකර ගතයුතුව තිබූ වර්ෂ 05 ඉක්මවූ වැඩ පූර්ව අත්තිකාරම්වල වටිනාකම රු: 20,954,000 ක් වූ අතර, එයින් රු: 18,293,231ක් 2003 දී අවසන්වූ $ජී. කලාපයේ මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය සහ මහවැලි $එච්. කලාපය තුළ ක්‍රියාත්මක කරන ලද 2005 වර්ෂයේ අවසන්ව තිබූ ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (එම්ආර්ආර්පී) යටතේ කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ වැඩ පූර්ව අත්තිකාරම් වූ අතර, මේවා අයකර ගැනීම සඳහා කිසිදු නීතිමය ක්‍රියා මාර්ගයක් අධිකාරිය ගෙන නොතිබුණි. මෙම ව්‍යාපෘති යටතේම කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබූ මුදල් අත්තිකාරම් වූ රු: 12,895,522 ක් ද අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2012 අගෝස්තු 02 දින මේ පිළිබඳව සොයා බැලීම සඳහා කමිටු දෙකක් පත්කර ඇති බව අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර විය.

### 1.2.5 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| <u>නීති,රීති සහ රෙගුලාසි යනාදියට යොමුව</u> | <u>අනුකූල නොවීම</u> |
|---|---|

| | | |
|---|---|---|
| (අ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 487 (2) ඡේදය | සී/ස මහවැලි කෘෂි සේවා පුද්ගලික සමාගම සහ සී/ස මහවැලි ඉංජිනේරු සේවා පුද්ගලික සමාගම මෙම පනත යටතේ ලියාපදිංචි කර නොතිබුණි. |
| (ආ) | ආයතන සංග්‍රහයේ viii පරිච්ඡේදයේ 10:1 වගන්තිය, 1984 ජුනි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 256/84, 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89, 1989 අගෝස්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 39/89 හා 1997 පෙබරවාරි 03 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/97 | 2007 හා 2008 වර්ෂවල මාසයකට එක් දිනක් බැගින් දින 24 ක් නිවාඩු දිනවල සේවය කළ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපත් කර තිබූ වවුචරයක් සඳහා පූර්ව අනුමැතිය, පැමිණි දිනයන්, වේලාවන්, සිදුකළ රාජකාරී පිළිබඳ තහවුරු ලබාගැනීමකින් තොරව 2008 දෙසැම්බර් 31 දින රු: 78,165 ක් ගෙවා තිබුණි. |
| (ඇ) | 1994 ජුනි 04 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2000 ජනවාරි 11 දිනැති අංක පීඑෆ්/පීඊ 05 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රජයට පවරා ගත් සමාගම්වල සේවකයින්ට ගෙවිය හැකි වනුයේ අමාත්‍ය මණ්ඩල හෝ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය හෝ මහා භාණ්ඩාගාරය විසින් අනුමත කරනු ලැබූ ප්‍රතිලාභ පමණක් වුවත්, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත අධිකාරියේ හා වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ සියළුම ඉංජිනේරුවන්ට සහ වරලත් සුදුසුකම් නොලැබූ වෙනත් නිලධාරීන් 03 දෙනෙකුට සහ වරලත් සුදුසුකම් ලැබූ එක් නිලධාරියෙකුට සමාලෝචිත වර්ෂය සඳහා රු: 16,041,929ක මුදලක් වෘත්තීය දීමනා ලෙස ගෙවා තිබුණි. |
| (ඈ) | 2006 මාර්තු 01 දිනැති ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ චක්‍රලේඛ අංක 09 හි 8:12 ඡේදය | මහවැලි $බී. ඒකාබද්ධ ව්‍යාපෘතියේ මාර්ග ඉදිකිරීම් කොන්ත්‍රාත් 04 ක් වෙනුවෙන් ගෙවා තිබූ වැඩ පූර්ව අත්තිකාරම් රු: 16,471,600 සඳහා වූ රු: 1,976,586 ක වැට් බදු ගෙවා නොතිබුණි. |
| (ඉ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ<br>(i) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 2006/30 දරන චක්‍රලේඛය | චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව 2007 ඔක්තෝබර් 18 දිනැති අංක 2007/198/2480 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මගින් නිල බලයෙන් අධ්‍යක්ෂ මණ්ඩල සභාපති අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ වැටුප් 2006 ජූලි 02 දින සිට ක්‍රියාත්මක වන පරිදි රු: 61,655 (එච්එම් -2-3 වැටුප් ක්‍රමයේ 10 වන පියවර) දක්වා ඉහළ දමා තිබුණි. |

| | |
|---|---|
| | ඒ අනුව 2006 ජුනි සිට 2007 ඔක්තෝබර් දක්වා හිඟ වැටුප් ලෙස රු: 276,751 ක් 2007 නොවැම්බර් මාසයේදී ලබා ගෙන තිබුණි. |
| (ii) 2006 දෙසැම්බර් 31 දිනැති අංක ඩීඑම්එස්/ඒ1/වැටුප් දරන චක්‍රලේඛයේ ix ඡේදය | මෙම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගෙන තිබුණු අධ්‍යක්ෂ (මුදල්) වෙත රු: 55,000 ක මාසික දීමනාවක් ගෙවා තිබූ අතර, කොන්ත්‍රාත් ගිවිසුමකින් හෝ පත්වීම් ලිපියේ කොන්දේසිවලට අදාල නොවන දීමනාවන් 04 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු: 1,348,287 ක මුදලක් ගෙවා තිබුණි. |

## 1.2.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සයඹලාගහගම, පනංකානිය හා හිරියාලේ යන වැව් තුනෙහි රොන්මඩ හා ජලජ පැලැටි ඉවත් කර ප්‍රතිසංස්කරණය කිරීමේ කටයුතුවලට අදාල රු: 5,971,940 ක අගයකින් යුතු ඇස්තමේන්තු අනුමත කර ගැනීමට පෙර එම කාර්යයන් නිමකර තිබුණි.

රණෝරාව වැවෙහි ඉහත සඳහන් ප්‍රතිසංස්කරණ කටයතු වාර දෙකකදී එකම ගොවි සංවිධානයක් මඟින් රු: 2,566,282 ක වටිනාකමට සකස් කළ ඇස්තමේන්තු දෙකක් මඟින් සිදුකර තිබුණි. මෙය ගොවි සංවිධාන වෙත ලබාදිය හැකි කොන්ත්‍රාත් සීමාව වූ රුපියල් මිලියන 2 ඉක්මවන අතරම, එකම කාර්යයක් සඳහා විධිමත් ඇස්තමේන්තුවක් සකස් නොකිරීමේ දුර්වලතාවයක්ද නිරීක්ෂණය විය.

(ආ) සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාරික (පුද්ගලික) සමාගම වෙත අධිකාරිය විසින් පවරා තිබූ අක්කර 1200 ක් වූ මුතුවැල්ල සත්ව ගොවිපල සහ අක්කර 1500 ක් වූ සිද්ධපුර සත්ව ගොවිපල අවිධිමත් ආකාරයට සීඅයිසී කෘෂිකාර්මික (පුදගලික) සමාගම වෙත අධිකාරියේ එකගත්වයක් නොමැතිව පවරාදී තිබූ අතර, ඒ සඳහා බදු කුලී අයකර නොතිබුණි.

## 1.2.7 අවිධිමත් ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) බදු කුලී අය නොකිරීම

ටී.බී.ජයා මාවතේ පිහිටි අධිකාරියට අයත් කාර්යාල ඉඩ වර්ග අඩි 12,432ක පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යවරයාගේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා විධිමත් ගිවිසුමකින් තොරව 2011 වර්ෂයේදී කුලියට ලබාදී තිබූ අතර, එම වර්ෂය වෙනුවෙන් අයකර ගතයුතුව තිබූ හිඟ බදු කුලිය රු: 7,661,373 ක් විය.

(ආ) <u>වාහන අපයෝජනය</u>

$එච්. කලාපයේ නේවාසික ව්‍යාපාර කළමනාකරු විසින් 2010 මැයි මාසයේ සිට ඔහුට වෙන්කර තිබූ වාහනයට අමතරව, අනුමැතියකින් තොරව තවත් වාහනයක් භාවිතා කර තිබුණි. මෙම වාහනය 2010 මැයි මාසයේ සිට කාර්යාල පරිශ්‍රයට පැමිණ නොතිබූ නමුත්, ඔහු විසින් එහි සියළු ගමන් සඳහා අත්සන් යොදා සහතක කර තිබුණි. වාහනයේ දෛනික ධාවන කටයුතු තඹුත්තේගමින් ආරම්භ කරන බව දක්වා තිබුණද, ඒ බව පැමිණීමේ ලේඛණ සහ ගේට්ටු වාර්තා අනුවද තහවුරුවී නොතිබුණි.

මේ සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂාවක් සිදුකර මෙම වාහනය කාර්යාලයේ භාවිතා නොකළ කාලය තුළ කාර්යාලය මඟින් දරා තිබූ රු: 201,385 ක් ව අළුත්වැඩියා වියදම් සහ නව ටයර් 04 ක් සඳහා වූ වියදම් අදාල නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එසේම 2011 සැප්තැම්බර් 16 සිට නේවාසික ව්‍යාපාර කාර්යාලය වෙත තවත් නේවාසික ව්‍යාපාර කළමනාකරුවෙක් අනුයුක්ත කර තිබුණි. මේ අනුව අදාල නිලධාරීන් දෙදෙනා විසින් 2011 දෙසැම්බර් 31 දක්වා අනුමැතියකින් තොරව භාවිතා කර තිබූ ඉන්ධන සඳහා අධිකාරිය දරන ලද වියදම රු: 682,298 ක. මෙම මුදලද 2012 ජුනි දක්වා අයකර නොතිබුණි.

## 02 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ දායකත්වය සැලකිල්ලට ගැනීමට පෙර රු: 1,930,432,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු: 2,205,591,000 ක් විය. රු: 1,780,000,000 ක් වූ රජයේ දායකය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු: 150,432,000 ක දක්වා අඩුවී තිබූ අතර, රු: 1,730,000,000 ක් වූ ඉකුත් වර්ෂයේ රජයේ දායකය ගණන් ගැනීමෙන්

පසුව එම වර්ෂයේ ඌනතාවය රු: 475,591,000 ක් දක්වාත් අඩුවී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලවල රු: 325,159,000 ක වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද ආදායම් ප්‍රකාශය අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම් හා වියදම් පිළිබඳ විග්‍රහාත්මක සමාලෝචනයක් පහත දැක්වේ.

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ඌනතාවය රුපයල් මිලියන 325 ක් හෙවත් 70% කින් අඩුවී තිබූ අතර, ඉකුත් වර්ෂයේ බොල්ණය සඳහා රු.මිලියන 266.8ක් වෙන් කිරීමත්, සමාලෝචිත වර්ෂයේ එවැනි වෙන්කිරීම් නොවීමත් ඊට ප්‍රධාන හේතුවවී තිබුණි.

(ආ) 2010 වර්ෂය හා සැසඳීමේදී 2011 වර්ෂයේදී නඩත්තු වියදම් 36% ක් හෙවත් රුපියල් මිලියන 5.9 කින් වැඩිවී තිබූ අතර, වෙනත් වියදම් 37% ක් හෙවත් රුපියල් මිලියන 22.7 කින් වැඩිවී තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් අධිකාරිය ලද ආදායම රුපියල් මිලියන 77 කින් හෙවත් 22% කින් වැඩිවී තිබූ අතර, වෙනත් ආදායම් රුපියල් මිලියන 32 කින් හෙවත් 81% කින් ද, බදු ආදායම රුපියල් මිලියන 22 කින් හෙවත් 10% කින් ද වැඩිවීම ඒ සඳහා හේතුවී තිබුණි.

(ඇ) චක්‍රීය අරමුදලේ ආදායම රුපියල් මිලියන 5 කින් හෙවත් 21% කින් අඩුවීම හැර ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ඉතිරි ආදායම් අයිතම 4 ක් 15% සිට 94% දක්වා ප්‍රමාණයකින් වර්ධනයවී තිබුණි.

## 03 මෙහෙයුම් සමාලෝචනය

## 3.1 කාර්ය සාධනය

### 3.1.1 සමස්ත භූමි සංවර්ධනය

මහවැලි මහ සැලැසමට අනුව සංවර්ධනය කිරීමට අපේක්ෂිත කලාප 14 ක වූ මුළු බිම් ප්‍රමාණය හෙක්ටයාර 420,170 ක් විය. දැනට සංවර්ධනය කර ඇති බිම් ප්‍රමාණය හෙක්ටයාර 102,528 ක් වූ අතර, මොරගහකන්ද ව්‍යාපෘතිය යටතේ දැනට සංවර්ධනය කෙරෙමින් පවතින ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 81,422 ක් විය. ඉතිරි හෙක්ටයාර 236,220ක ඉඩම් සංවර්ධනය සඳහා තවමත් නිශ්චිත සංවර්ධන වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පිළිතුර පරිදි වර්තමාන සමාජයීය අවශ්‍යතාවයන් අනුව මහවැලි මහ සැලැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතු දැනට කරගෙන යනු ලබන බවත්, එහි ප්‍රතිඵල අනුව ඉදිරි කටයුතු සැලසුම් කරන බවත් දකවා තිබුණි.

### 3.1.2 ව්‍යාපෘති කාර්ය සාධනය

2011 වර්ෂය සඳහා අධිකාරියේ ප්‍රාග්ධන වියදම් ඇස්තමේන්තුව රුපියල් මිලියන 6,392 ක් වූ අතර, සත්‍ය වියදම රුපියල් මිලියන 3,755 ක් විය . ඉතිරි ප්‍රතිපාදනයේ ප්‍රතිශතය 41% ක් වූ අතර, පහත ව්‍යාපෘතිවල කාර්යය සාධනය අඩු මට්ටමක පැවතීමට මෙය හේතුවී තිබුණි.

| | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු කළ මුදල | වැය කළ මුදල | ප්‍රතිපාදන ඉතිරිය | ඉතිරියේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| | | රු: මිලියන | රු:මිලියන | රු:මිලියන | % |
| (අ) | වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය | 2,412 | 1,233 | 1,179 | 48.9 |
| (ආ) | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 2,280 | 1,236 | 1,044 | 45.7 |
| (ඇ) | ශක්‍යතා අධ්‍යයනයන් | | | | |
| | (i) මොරගහකන්ද කළුගඟ පහළ නිම්න සංවර්ධනයන් | 300 | 11 | 289 | 96 |
| | (ii) මල්වතු ඔය, මාදුරුඔය දකුණු ඉවුර සහ වැලිඔය | 20 | - | 20 | 100 |
| (ඇ) | මහවැලි කලාපවල වියදම් | 1,095 | 798 | 297 | 27 |
| | ප්‍රධාන කාර්යාලය | 200 | 56 | 144 | 72 |

**3.1.3** නියැදි පරීක්ෂණවලදී හෙළිවූ පරිදි මහවැලි $එච්. කලාපයේ හා $බී. කලාපයේ ඒකාබද්ධ ව්‍යාපෘතියේ පහත සඳහන් කාර්යයන්හි කාර්යය සාධනය පහළ මට්ටමක පැවතුණි.

**(අ) 50% ට වඩා අඩු ප්‍රගතියක් සහිත ව්‍යාපෘති**

පහත සඳහන් ව්‍යාපෘතිවල කාර්යය සාධනය සමාලෝචිත වර්ෂය අවසානයට 50% කට වඩා අඩු මට්ටමක පැවතුණි.

- එක් දින වයස් කුකුළු පැටවන් ලබාදීමේ වැඩ සටහන් ප්‍රගතිය 44% ක් පමණ විය.
- ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘතියේ ප්‍රගතිය 37% ක් පමණ විය.

<u>මහවැලි $එච්. කලාපය</u>

- වැව් සඳහා මත්ස්‍ය ඇඟිල්ලන් යෙදීමේ වැඩ සටහන ප්‍රගතිය 18.5% ක් විය.
- කොම්පෝස්ට් නිෂ්පාදිත ඒකක පිහිටුවීමේ වැඩ සටහන් ප්‍රගතිය 34%ක් විය.

- කිරි ගවයන් බෙදාදීමේ වැඩසටහනේ ප්‍රගතිය 34% ක විය.

කර

**(ආ) 50% ට වඩා සම්පූර්ණ කර එහෙත් 2011 දෙසැම්බර් 31 දිනට අවසන් නොමැති ව්‍යාපෘති**

<u>මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය-$බී. කලාපය</u>

- කිරිගවයන් ලබාදීමේ වැඩසටහන යටතේ වර්ෂය තුළ ලඟා කරගෙන ඇති ඉලක්කය 75% ක් විය. මෙම ව්‍යාපෘතිය යටතේ 2007-2012 ව්‍යාපෘති කාලය තුළ කිරිගවයන් 1000 ක් බෙදාදීමට ඉලක්ක කලද, 2011 දෙසැම්බර් 31 වනවිට ලබාදී තිබූ කිරිගවයන් ප්‍රමාණය 522 ක් විය.

  මේ අනුව වැඩ සටහනේ මුළු ප්‍රගතිය 52% කි.

<u>මහවැලි -$එච්. කලාපය</u>

- වගා ළිං ඉදිකිරීම - ප්‍රගතිය 50%

**(ඇ) ක්‍රියාත්මකවී නොමැති ව්‍යාපෘති**

ඒකාබද්ධ $බී. ව්‍යාපෘතියේ හා $එච්. කලාපයේ සැලසුම් කරන ලද පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

- ගොවි සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන්
- තෝරාගත් වැව් සඳහා මත්ස්‍ය දැල් ලබාදීම
- ෆයිබර් බෝට්ටු ලබාදීම
- කාන්තා සංවර්ධන කටයුතු

– ව්‍යවසාය හා වෙළඳපළ සංවර්ධන වැඩසටහන්

### 3.1.4 පුහුණු වැඩසටහන්

$එච්. කලාපයේ පිහිටි අධිකාරියට අයත් පුහුණු මධ්‍යස්ථානය වූ නෙල්හිරියාව පුහුණු මධ්‍යස්ථානය, අධිකාරියේ සේවකයින්ගේ සේවා තත්ත්වය නංවාලීම සඳහා වූ පුහුණු වැඩසටහන් සහ කලාපය තුළ පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට අදාල ස්වයං රැකියා පුහුණු වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීම සඳහා පැවතියද, 2011 වර්ෂය තුළ ඊට අදාල කිසිම පුහුණු වැඩසටහනක් සංවිධානය කර පවත්වා නොතිබුණි. මේ නිසා මෙම පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීමේ අරමුණු ඉටුනොවන බව නිරීක්ෂණය වේ.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

2011 දෙසැම්බර් 31 දිනට අධිකාරියට විරුද්ධව සහ අධිකාරිය විසින් පවරා තිබූ නඩු සංඛ්‍යාව 152 ක් විය.
ඒ පිළිබඳ පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) පුද්ගලික සමාගම විසින් කොත්මලේ නිවාඩු නිකේතනය පවත්වාගෙන යන භූමිය ඔවුන්ට පවරා නොදීම සම්බන්ධයෙන් රු: මිලියන 100 ක් වන්දි ඉල්ලා 2007 වර්ෂයේදී නඩුවක් පවරා තිබුණි.

1992 ජූලි 15 දිනැති අංක අමප/1992 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව ඉහත සමාගම සමඟ අධිකාරිය සම්බන්ධවී චිත්‍රපට ස්ථාන සංකීර්ණයක් නිර්මාණය කළයුතු වුවද, දෙපාර්ශවයම ඒ සඳහා ක්‍රියාකර නොතිබුණි.

(ii) සේවකයන් 15 දෙනෙකු සේවයෙන් ඉවත් කිරීම සම්බන්ධයෙන් කම්කරු විනිශ්චය සභාව ලබාදුන් තීන්දුවකට එරෙහිව මහාධිකරණයට සහ නීතිපතිගේ උපදෙස් ද නොතකා ශෙෂ්ඨාධිකරණයට අභියාචනා ඉදිරිපත් කර තිබූ නමුත්, ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය වෙනස්වී නොතිබුණි.

ඒ අනුව 2007 දෙසැම්බර් සිට 2010 ජූලි දක්වා හිඟ වැටුප් වශයෙන් රු: 8,000,301 -ක මුදලක් ගෙවන ලෙස 2011 දෙසැම්බර් 23 නීතිපති උපදෙස් ලැබී තිබූ අතර, 2012 අගෝස්තු දක්වා එම මුදල් ගෙවා නොතිබුණි. මේ අනුව ඉහළ උසාවිවලට අභියාචනා ඉදිරිපත් කිරීම නිසා සේවය ලබා නොගෙනම සේවකයන් 13 දෙනෙකු සඳහා වන්දි ගෙවීමට පමණක් අධිකාරියට සිදුවී තිබුණි.

(iii) 1997 වර්ෂයේදී අධිකාරියේ රියදුරකු විසින් පදවනු ලැබූ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට අයත් ලොරියක ගැටී මියගිය පුද්ගලයකු වෙනුවෙන් නඩු තීන්දුවක්

මත ඔහුගේ යැපෙන්නන් හට රු: 1,900,000 ක වන්දියක් 2012 මාර්තු 26 දින අධිකාරියට ගෙවීමට සිදුවී තිබුණි.

මෙම වාහනය අනතුරට පත්වන අවස්ථාවේ අයිතිය, ආදායම් බලපත්‍රය ඉඩම් කොමසාරිස් වෙත පැවතීම නිසාත්, රක්ෂණ සහතිකය මෙනෙක් සංස්ථාවට ඉදිරිපත් නොකිරීම නිසාත්, රක්ෂණ වන්දි ලබාගැනීමේ හැකියාවක්ද නොමැති බව නිරීක්ෂණය විය.

මෙම නඩුව පවත්වාගෙන යාම පිළිබඳ විස්තර පරීක්ෂාවේදී හෙළිදරව් කරගත් පරිදි අධිකාරියේ නීති අධ්‍යක්ෂ විසින් නීතිමය අවශ්‍යතාවය පරිදි අභියාචනා දැන්වීමේ අත්සන් නොකිරීම නිසා මහාධිකරණයට ඉදිරිපත් කරන ලද අභියාචනය නිෂ්ප්‍රභා කර තබුණි.

## 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

$එච්. කලාපයේ ගබඩා පරීක්ෂාවේදී හෙළිදරව් කරගත් පරිදි 2009 හා 2010 ගබඩා සමීක්ෂණවලදී විනාශ කළයුතු හෝ ටෙන්ඩර් කර විකිණිය යුතු වශයෙන් හඳුනාගෙන තිබූ ලීබඩු උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය, වාහන අමතර කොටස් ඇතුළු භාණ්ඩ විශාල ප්‍රමාණයක් අවශ්‍ය ක්‍රියාමාර්ග නොගෙන ගබඩාවල රඳවා තිබුණි.

## 3.4 අරමුදල් ඌන උපයෝජනය

ඒකාබද්ධ ව්‍යාපෘතිය $බී. කලාපය යටතේ රුපියල් මිලියන 270 ක වියදමින් කොට්ඨාශ 06 ක ග්‍රාම නිලධාරී වසම් 31 ක පානීය ජල යෝජනා ක්‍රම 25 ක් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණද, 2011 ඔක්තෝබර් විගණන දින වනවිට ක්‍රියාත්මක කර තිබුණේ රුපියල් මිලියන 67.6 ක් වටිනා විශාල ජල යෝජනා ක්‍රම 04ක් පමණි.

## 3.5 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත කරුණු නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | වත්කම් සංඛ්‍යාව | පිරිවැය හෝ තක්සේරු වටිනාකම රු: | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජන තත්ත්වය | නිෂ්ක්‍රීයව පැවති කාලය |
|---|---|---|---|---|---|
| (අ) | වාහන - $එච්. කලාපය | | | | |
| | අළුත්වැඩියාව සඳහා මඩාටුගම යාන්ත්‍රික ඉංජිනේරු වෙත 2011 ජූලි 12 භාරදුන් වාහන | 09 | 7,850,000 | නිෂ්ක්‍රීය | වර්ෂ 03 ක පමණ |
| (ආ) | තෙල්හිරියාව පුහුණු | | | | |

| | | | | |
|---|---|---|---|---|
| <u>මධ්‍යස්ථානය</u> | | | | |
| i නේවාසිකාගාරය සහ නිල නිවාස | 02 | 1,647,300 | නිෂ්ක්‍රීය | 2009 වර්ෂයේ සිට |
| ii ක්‍රියා විරහිත පැරණි ජල පොම්පාගාරය | 01 | ලබාගත නොහැක | නිෂ්ක්‍රීය | ගණනය කර නොතිබුණි. |
| iii ගොඩනැගිලි සංකීර්ණය | 01 | 15,285,000 | ඌන උපයෝජනය | වර්ෂ ගණනාවක සිට |

## 3.6 ආර්ථික නොවූ ගනදෙනු

$එච්. කලාපයේ වැව් 04 ක රොන් මඩ ඉවත් කර සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා රු: 21,862,487 ක අගයකට සකස් කරන ලද ඇස්තමේන්තු 04 ක් විධායක අධ්‍යක්ෂකගේ (තාක්ෂණ සේවා) උපදෙස් අනුව ප්‍රමාද වන නිසා ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් බැහැරව ගොවි සංවිධාන වෙත ප්‍රදානය කළ හැකි වන සේ එක් ඇස්තමේන්තුවක් රුපියල් මිලියන දෙක නොඉක්මවන පරිදි රු: 7,697,308 අගයකට නැවත සකස් කර තිබුණි.

ඇස්තමේන්තු වෙනස් කිරීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැවේ නම | සම්පූර්ණ ප්‍රතිසංස්කරණ සඳහා ඇස්තමේන්තුව | සංශෝධනය කළ ඇස්තමේන්තුව |
|---|---|---|
| | රු: | රු: |
| i දුනුදඹු වැව | 6,195,487 | 1,996,650 |
| ii. කරඹෑව වැව | 6,763,997 | 1,997,433 |
| iii. පහල වැටියාව වැව | 6,702,256 | 1,706,575 |
| iv. ඔත්තප්පුව පන්සලේ වැව | 2,200,745 | 1,996,650 |
| | 21,862,485 | 7,697,308 |

නැවත සකස් කළ ඇසතමේන්තු අනුව හෙළිදරව් වූයේ කලින් සැලසුම් කළ කාර්යයන්වලින් 1/3 ක් පමණක් ඉටුකිරීමට හඳුනාගෙන තිබූ බවයි. එහෙත් රොන්මඩ ඉවත් කිරීම වැනි කාර්යයකින් 1/3 ක කොටසක් පමණක් ඉටුකිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන බව නිරීක්ෂණය විය.

## 3.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

$බී. කලාපයේ ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ අසේලපුර කොට්ඨාශයේ රන්සරතැන්න ඒකකයේ ඩී 402 කෙත් ඇලවල් පුනරුත්ථාපනය කිරීම සඳහා රු: 2,931,015 ක මුදලකට පවරා තිබූ කොන්ත්‍රාත්තුව 2010 අප්‍රේල් 12 වන විට වැඩ නිම නොකර අතහැර හැරදමා ගොස් තිබූ නමුත්, 2010 මැයි 14 දින රු: 3,559,998 ක් වටිනා අසේලපුර, කුරුළුබැද්ද ඒකකයේ බෙදා හැරීම් ඇල පුනරුත්ථාපනය සඳහා

වූ කොන්ත්‍රාත්තුව නැවත ඔහු වෙත පිරිනැමීමට මහවැලි ඒකාබද්ධ පුනරුත්ථාපන ව්‍යාපෘතියේ ($බී. කලාපය) නිලධාරීන් විසින් කටයුතු කර තිබුණි. 2011 අප්‍රේල් 30 දින කොන්ත්‍රාත්කරු විසින් එම කොන්ත්‍රාත්තුවද අතහැර දමා ගොස් තිබුණි.

හැර දමා ගිය කොන්ත්‍රාත්තුව වෙනුවෙන් ඔහුගෙන් අයකර ගතයුතු මුදල රු: 830,927 ක් වූවත්, එය 2011 දෙසැම්බර් 31 දින දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් අධිකාරියේ සම්පත්

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 12 හි 8:3:9 ඡේදයට පටහැනිවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2011 දෙසැම්බර් 31 දින වන විට අධිකාරියට අයත් වාහන 11 ක් කෘෂි සංවර්ධන අමාත්‍යාංශය මගින්ද, තවත් වාහන 15 ක් වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය විසින්ද, තවත් වාහන 06 ක් වෙනත් පාර්ශවයන් විසින්ද භාවිතා කර තිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 වන විට අධිකාරියේ ස්ථිර කාර්යය මණ්ඩලයට ඇතුළත් රියදුරන් 10 දෙනෙකු වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන වෙත මුදාහැර තිබූ අතර, ඔවුන්ගේ වැටුප් අධිකාරිය විසින් දරා තිබුණි. ඒ සඳහා 2011 දෙසැම්බර් 31 දිනට අදාල ආයතනවලින් ප්‍රතිපූරණය කරගතයුතු වූ මුදල රු: 3,138,762 ක් විය.

(ඇ) විදේශාධාර ව්‍යාපෘතියක් වූ වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ කටයුතු සඳහා අධිකාරියේ ස්ථිර කාර්යය මණ්ඩලයට අයත් ඉංජිනේරුවන් 22 ක්, රියදුරන් 7 ක් ඇතුළු අනෙකුත් තනතුරුවල 17 දෙනෙක්ද අනුයුක්ත කර තිබූ අතර, මෙම අනුයුක්ත කිරීම් 2007 අපේල් 05 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 පරිදි විධිමත්ව සිදුකර නොතිබුණි.

ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබූ මෙම සියළු නිලධාරීන් සඳහා ඉහත චක්‍රලේඛයේ 4:1:3 ඡේදයේ විධිවිධාන යටතේ වැටුපෙන් 1/3 ක දීමනාව පමණක් ලබාදී තිබූ නිසා ඔවුන් වැඩ ආවරණ පදනමින් ව්‍යාපෘතියට අනුයුක්ත කර තිබූ බව නිරීක්ෂණය විය. එහෙත් මෙම නිලධාරීන්ගෙන් කිසිදු සේවයක් අධිකාරියට සිදුවී නොතිබූ අතර, අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙන් පමණක් නිලධාරීන් 29 දෙනෙකුට 2011 වර්ෂයේ ගෙවූ රු: 11,010,096 ක් වූ වැටුප් අධිකාරියට නිෂ්කාර්ය වියදමක් බව නිරීක්ෂණය විය.

## 3.9 ප්‍රමාදවූ ව්‍යාපෘති

(අ) නියැදි පරීක්ෂාවකදී හෙළිදරව් කරගත් පරිදි $බී. කලාපයේ ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ රු: 3,059,720 ක් වූ මහසෙන්පුර ඒකකයේ ක්‍රියාත්මක කරන අතු ඇලවල් පුනරුත්ථාපනය

සඳහා වූ කොන්ත්‍රාත්තුව සහ පැලැටියාව ජල යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන් දක්නට ලැබුණි.

(ආ) අතරමග නවතා දමා තිබූ ව්‍යාපෘතිය

විස්තර පහත දැක්වේ.

| අනු අංකය | කොන්ත්‍රාත් අංකය | කාර්යය | කොන්ත්‍රාත් වටිනාකම රු: | 2011 දෙසැ: 31 දිනට ප්‍රගතිය % |
|---|---|---|---|---|
| (i) | එස්වයිබී/එම්සීපී/24ඒ/ඩීසී/ආර්එෆ්සී79 | කුරුඑබැද්ද ඒකකයේ බෙදා හැරීමේ ඇල පුනරුත්ථාපනය | 3,559,998 | ගණනය කර නොතිබුණි |
| (ii) | එස්වයිබී/එම්සීපී/ඉසෙඩ්1/ආර්එෆ්සී/ඩබ්ලිව්එස්/4 | පැලැටියාව ජල යෝජනා ක්‍රමය | 22,376,912 | ගණනය කර නොතිබුණි. |

අතහැර දමා ගොස තිබූ කොන්ත්‍රාත් 03 ක් සඳහා වැඩිපුර ගෙවා තිබූ මුදල රු: 4,920,508 ක් වූ අතර, එම මුදල් අයකර නොතිබූ අතර, අධ්‍යක්ෂ ජනරාල්වරයාට අනුව වැඩිපුර ගෙවූ මුදල් අයකර ගැනීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කර තිබුණි.

## 3.10 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) $එච්. කලාපයේ සමස්ථ කාර්ය මණ්ඩලය

i. 2011 දෙසැම්බර් මාසයේ $එච්. කලාපයේ සිදුකළ විගණන පරීක්ෂාවේදී කලාප කාර්යාලයේ, කොට්ඨාශ කාර්යාල 07 හි සහ ඒකක කාර්යාල 26 හි කාර්ය මණ්ඩලය 135 ක්වූ නමුත්, සත්‍ය සේවක සංඛ්‍යාව 69 ක් වයෙන් පුරප්පාඩු 66 ක් පැවතුණි.

ද්විතියන සහ තෘතිය මට්ටමේ තනතුරුවල පුරප්පාඩු 48% ක් පැවති අතර, මෙම සේවක හිඟය නිසා අදාල කාර්යාලවල කටයුතු විධිමත්ව හා කාලීනව සිදුකිරීමේ ගැටළු ඇතිවී තිබුණි.

ii. ඉහත පරිදි තනතුරුවල සේවක පුරප්පාඩු පැවතියදී කම්කරු ආදී තනතුරු 04 ක් සඳහා සේවකයන් 27 ක අතිරික්තයක් පැවතුණි.

ඉහත කරුණු අනුව $එච්. කලාපයේ සේවක මණ්ඩලය ආයතනයේ අරමුණු ඵලදායීව ඉටුකර ගත හැකිවන පරිදි කළමනාකරණය කර නොතිබූ බව නරීක්ෂණය විය.

(ආ) 2011 සැප්තැම්බර් 30 දිනට $බී. කලාපයේ ක්‍රියාත්මක මහවැලි ඒකාබද්ධ $බි. ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සහ මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබුණි.

## 04 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම

(අ) 2011-2015 සඳහා සංයුක්ත සැලැස්මක් මුලින් සකස් කර තිබූ අතර, 2012 වර්ෂයේදී 2012-2016 වර්ෂ 05 සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර තිබුණි.

(ආ) මහින්ද චින්තන දස අවුරුදු සැලැස්ම අනුව වාරි අංශය විසින් ළඟා කරගත යුතු ඉලක්කයන් පිළිබඳව සංයුක්ත සැලැස්මේ සඳහන් කර තිබුණද, එම ඉලක්ක කරා යාමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීමට සැලසුම් සකස් කර නොතිබුණි.

(ඇ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 වගන්තිය අනුව සැලසුම්ගත කාර්යයන් සම්බන්ධව වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන ඒ පිළිබඳව සංයුක්ත සැලැස්මේ දක්වා තිබිය යුතු වුවත්, එසේ දක්වා නොතිබුණි.

### 4.2. අභ්‍යන්තර විගණනය

(අ) 2010 නොවැම්බර් 30 දින සිට ප්‍රධාන අභ්‍යන්තර විගණක තනතුර පුරප්පාඩුව් ඇති අතර, 2012 ජුනි 15 දක්වා සුදුසුකම්ලත් ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු බඳවා ගෙන නොතිබුණි.

(ආ) අභ්‍යන්තර විගණන අංශය සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන නොතිබූ අතර, 2011 දෙසැම්බර් 31 දිනට අභ්‍යන්තර විගණන නිලධාරී තනතුරු 10 ක සහ විගණන සහකාර තනතුරු 03 ක පුරප්පාඩු පැවතුණි.

(ඇ) අභ්‍යන්තර විගණන ඒකකය ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර තිබූ අතර, කලාප කාර්යාලවල නිරන්තර අභ්‍යන්තර විගණනයන් සිදුකර නොතිබුණි.

### 4.3 ප්‍රසම්පාදන සැලැස්ම

2011 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබූ නමුත්, එය ප්‍රමාණවත් පරිදි ක්‍රියාවේ යොදවා නොතිබුණි.

### 4.4 අයවැය පාලනය

අයවැය ලේඛනයක් සකස් කර ඒ අනුව මුදල් වෙන්කර ගන්නා නමුත්, වර්ෂය අවසානයේදී සිදුවී ඇති වැය සළකා බලා ඒ අනුව මුළු වියදම වෙනස් නොවන පරිදි අය-වැය සංශෝධනය කර එම අයවැය සඳහා නැවත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම සිදුකරනු ලබන බැවින්, අයවැය ලේඛනය පාලන කාරකයක් ලෙස යොදා නොගන්නා බව නිරීක්ෂණය විය.

## 5 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර අධිකාරියේ අධ්‍යකෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතු වේ.

(අ) ඉඩම් බදුදීම

(ආ) ගොඩනැගිලි උපයෝජනය

(ඇ) ක්‍රියාකාරී සැලැස්ම පරිදි සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම

  (i) කිරිගව වැඩසටහන

  (ii) මිරිදිය මත්ස්‍ය සංවර්ධන වැඩසටහන

(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය

(ඉ) පුහුණු මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරවීම

(ඊ) ගොවිපල පරිපාලනය

(උ) ගබඩා පාලනය

(ඌ) බදු එකතු කිරීම

(එ) වාහන වෙන්කිරීම හා පාලනය

(ඒ) ගොවි සංවිධාන සමඟ ගිවිසුම් මගින් ශ්‍රමය ලබාගැනීම